# සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය සඳහා පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්.කේ.එම්.පී. වීරසූරිය [1]*

කිසියම් පුද්ගලයෙකු ජීවත්වන සමාජයට අනුව හැඩගැසීම සමාජානුයෝජනය ලෙස හඳුන්වයි. ඔහු හෝ ඇය ජීවත්වන සමාජ ක්‍රමයට අනුව සකස් නොවුණහොත්, එම පුද්ගලයා සමාජය විසින් ප්‍රතික්ෂේප කරන අතර, සමාජයේ කොටස්කරුවකු ලෙස පිළිනොගනී. පුද්ගලයාට තමා හඳුනාගැනීමට අවස්ථාව, සම්බන්ධතා ගොඩනගා ගැනීම, සමාජ සහභාගීත්වය ඇති කරගැනීම වැනි කරුණු රාශියක් සෘජුවම පවුල මූලික වේ. සමාජානුයෝජන කාරක අතරින් ප්‍රාථමික සමාජානුයෝජන කාරක යටතේ හඳුනාගත හැකි පවුල තුළින් සමාජයේ පැවැත්මට අවශ්‍ය දරුවකුගේ සමාජානුයෝජනය උදෙසා පවුලෙහි කාර්යභාර්ය ප්‍රබල ලෙස බලපායි. ඒවා හඳුනාගනිමින් ඒ සඳහා පවුලේ දායකත්වය කෙබඳුද යන්න දැක්වීම පර්යේෂණ ගැටලුව වේ. සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය සඳහා පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය පිළිබඳ පෙන්වාදීම මෙම පර්යේෂණයෙහි අරමුණයි. ප්‍රස්තුත පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක දත්ත රැස්කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීයික මූලාශ්‍රයන් වශයෙන් පොත්පත්, පුවත්පත්, සඟරා සහ පුස්තකාල පරිහරණය කරමින් මෙම පර්යේෂණය සිදුකරන ලදී. එමෙන්ම අන්තර්ජාලය භාවිතය ඔස්සේ දත්ත ග්‍රහණය කරගත් අතර මෙම විෂය පිළිබඳ ප්‍රමාණික දැනුමක් ලබාගැනීම සඳහා මේවා වැඩි වශයෙන් ඉවහල් විය. මෙම පර්යේෂණයෙහි දත්ත විශ්ලේෂණයේදී පුද්ගලයෙකු සමාජානුයෝජනය වන ක්‍රම කිහිපයක් ඇති බවත්, සමාජානුයෝජනයක මූලිකම හා වැදගත්ම කොටස ප්‍රාථමික සමාජානුයෝජනය බවත්, පවුල් පරිසරය ඇසුරු කරගෙන සිදුවන සන්නිවේදනයේදී ළදරුවා මෙහෙයවීම පවුල තුළින් සිදුවන බවත්, ජීව විද්‍යාත්මක මිනිසා සමාජීය මිනිසකු බවට පත්කරන මුල් අඩිතාලම දමන්නේ පවුල නම්වන සමාජානුයොජන කාරකය මඟින් බවත් අනාවරණය විය. ඒ අනුව ආගමික, අධ්‍යාපනය, ආර්ථිකය, පෞරුෂ සංවර්ධනය, ලිංගිකත්වය පිළිබඳ හඳුන්වාදීම, විනෝදය සහ විවේකය අර්ථවත්ව ගත කිරීමට දරුවාට අවස්ථාව ලබා දීම, මත්ද්‍රව්‍යවලින් වළකාගැනීම, ජීව විද්‍යාත්මක ප්‍රජනන කාර්යභාර්ය ආදි සමාජයේ පැවැත්මට අවශ්‍ය සමාජානුයෝජනය කෙරෙහි පවුල විසින් ඉටුවන සන්නිවේදන කාර්යභාර්ය සුළුපටු නොවන බව මෙම පර්යේෂණයෙන් නිගමනය වේ.

***ප්‍රමුඛ පද:*** අධ්‍යාපනය, පවුල, ලිංගිකත්වය, සමාජය, සමාජානුයෝජනය

[1] භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ssh2020497@ssh.rjt.ac.lk